දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට
மாவட்ட செயலகம் - ஹம்பாந்தோட்டை

1st Floor, Magam Ruhunupura Administrative Complex, Siribopura, Hambantota

"For a prosperous future"


DSH/DPS/07/DCC/වාර්තා/2025 | 2025.06.06

හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ
සියලුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

**<u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව - 2025.05.28</u>**

*2025.05.28* වන දින පවත්වන ලද හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවමි.

02. එම වාර්තාවේ ඔබ ආයතනයට අදාළ කාර්යන් ඉතා කඩිනමින් සාර්ථකව ඉටුකිරීමටත්, ඒ සඳහා අවශ්‍ය වෙනත් ආයතනවල සහයෝගය ලබා ගන්නා ලෙසත් දන්වා සිටින අතර, එම කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටළු නිරාකරණය කිරීම සඳහා අපගේ සහයෝගය අවශ්‍ය අවස්ථාවලදී නොපමාව ඒ පිළිබඳ දන්වා අවශ්‍ය කටයුතු සම්පාදනය කරගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලමි.

03. එසේම, 2025.06.25 දිනට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පැවැත්වීමට යෝජිත හෙයින් ඉහත වාර්තාවේ ඔබ වෙත පැවරී ඇති වගකීම් ඉටුකිරීම පිළිබඳ ප්‍රගතිය 2025.06.16 දිනට හෝ ඊට ප්‍රථම මා වෙත *DCC Hambantota WhatsApp* වෙත හෝ *dpshambantota@gmail .com* වෙබ් ලිපිනයට ලබා දීමට කටයුතු කරන ලෙස ද ඉල්ලමි.

04.තවද, මෙම වාර්තාව *www.hambantota.dist.gov.lk* දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ද ලබා ගත හැකි බව කාරුණිකව දැනුම් දෙමි.

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

බිමල් ඉන්ද්‍රජිත් ද සි...
දිස්ත්‍රික් ලේකම් / දිසා...
හම්බන්තොට

පිටපත්:-
01. දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර එම්.කේ.බන්දුල හරිස්චන්ද්‍ර මැතිතුමා - කරු.දැ.ගැ.ස.
02. හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති හා හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමා - කරු.දැ.ගැ.ස
03. ජනාධිපති ලේකම් - දැ.ගැ.ස
04. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - දැ.ගැ.ස


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| District Secretary | 047 2256235 | Additional District Secretary (Admin) | 047 2256232 | Additional District Secretary (Land) | 047 2256002 | Chief Accountant | 047 2256246 |
| Director (Agriculture) | 047 3628890 | Director (Planning) | 047 2256234 | Assistant District Secretary | 047 2256945 | Administrative Officer | 047 2256285 |
| Office | | Fax | 047 2256235<br>047 2256247 | email : moha.dist.hambantota@gmail.com<br>Web site : www.hambantota.dist.gov.lk | | | |


CamScanner

# හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම
## 2025.05.28

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පළාත් සභා හා පළාත් පාලන ගරු නියෝජ්‍ය අමාත්‍ය ප්‍රභා රුවන් සෙනරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2025.05.28 වන දින පෙ.ව. 9.00ට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

රැස්වීමට සහභාගී වූ සියලුම දේශපාලන නායකයින් හා අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් පිළිගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමන් වෙත රැස්වීමේ ඉදිරිකටයුතු කරගෙන යාම සඳහා අවස්ථාව ලබා දෙන ලදි.

ගරු සභාපති තුමා විසින් පැමිණ සිටි සියළුම දෙනා පිලි ගැනීමෙන් අනතුරුව, පසුගිය රැස්වීමේදී සාකච්ඡා වී වාර්තාවට ඇතුලත් නොවූ "පොල් පොහොර සහනාධාර ලබා දීමේ වැඩසටහන" සම්බන්ධව වාර්තාවට ඇතුලත් කිරීමට කටයුතු කරන ලෙස දැනුම් දෙමින් වාර්තාව සභා සම්මත කර න්‍යායපත්‍රයට අනුව සභාවේ කටයුතු සිදු කරන ලදි. එහිදී සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

පසුගිය රැස්වීම් වාර්තාවේ සංශෝධනය - "පොල් පොහොර සහනාධාර ලබා දීමේ වැඩසටහන"
දැනට තාවකාලිකව ඇතිවී තිබෙන පොල් හිඟයට දිගුකාලීන විසඳුමක් ලබාදීමේ රජයේ ප්‍රතිපත්තිය යටතේ අක්කර ¼ කට වැඩි අක්කර 5 ට අඩු දැනටමත් ඵල දරණ පොල් වගා සඳහා කිලෝ 50 ක පොහොර මිටියක් රු. 4000.00 ක සහනාධාර මිලකට භූමි ප්‍රමාණය අනුව ගොවීන්ට ලබා දීමේ ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇති බව පසුගිය රැස්වීමේදී දැනුම් දෙන ලදි.

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2025.05.28 දිනැති පසුගිය රැස්වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම. | | | | |
| 01. | ආයුර්වේද රෝහල අසල සිට තිස්ස හන්දිය දක්වා විදුලිය ලබා දීම. | මෙම කොටස සඳහා මාර්ග සංවර්ධන අධිකාරියෙන් විදුලිය ලබා දීම් කටයුතු සිදුකිරීම සඳහා විදුලිය ලබාදීමෙන් අනතුරුව නඩත්තු කටයුතු හා විදුලි බිල ගෙවීමේ කටයුතු නගර සභාවෙන් සිදුකරන බවට ලිඛිතව ලබා දීමෙන් පසු සිදුකල හැකි බවට කරුණු ඉදිරිපත් විය. | මේ බව ලිඛිතව කඩිනමින් ලබා දීමට පියවර ගන්නා ලෙස දැනුම් දෙන ලදි. | නාගරික කොමසාරිස්, මහා නගර සභාව |
| 02. | කිරින්ද ධීවර වරායේ අධික ලෙස වැලි ගොඩ ගැසීම නිසා අවට ප්‍රදේශයේ නිවාසවල ජීවත් වීමට නොහැකි තත්ත්වයක් උද්ගතවීම. | ගොඩගැසී ඇති වැලි වලින් වැලි කියුබ 14000ක් කොන්දේසි සහිතව ඉවත් කිරීමට වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් විසින් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සභාපති වෙත දැනුම් දුන්නත් වැලි ඉවත් කිරීමට මුදල් නොමැති හෙයින් මේ වන තෙක් ඉවත් නොවීම සම්බන්ධයෙන් සාකච්ඡා විය. | මේ සඳහා අදාල සියළු ආයතන සම්බන්ධීකරණය විය යුතු බවත් මෙකී වැලි ඉවත්කිරීම කඩිනම් විය යුතු හෙයින් ධීවර අමාත්‍යංශ ලේකම් වෙත දන්වා කඩිනම් පියවර ගැනීමට උපදෙස් දෙන ලදි. | සාමාන්‍යාධිකාරී, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව.<br>කැණීම් ඉංජිනේරු - භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය<br>සහකාර අධ්‍යක්ෂ, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, හම්බන්තොට.<br>සහකාර අධ්‍යක්ෂ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>කළමනාකරු ධීවර වරාය, කිරින්ද |
| 03. | යටාලතිස්ස පාසල් අධ්‍යාපනයෙන් පසු 6 වසර සඳහා සිසුන් ඇතුළත් කිරීම | 2025.05.29 දින දෙබරවැව ජාතික පාසලට 6 වසර සඳහා සිසුන් බඳවා ගැනීම සිදුවන බවත් දෙමාපියන්ගේ දැඩි විරෝධයක් | මේ අනුව අද දින අදාල පාසල් වල විදුහල්පති වරුන් සහ අදාල නිලධාරීන් හා දේශපාලන | දිස්ත්‍රික් ලේකම්<br>ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, දකුණු පළාත. |

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට



CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | බවතින බවත් කාලයක් තිස්සේ මෙම ගැටළුව සාකච්ඡා වුවත් විසඳුමක් නොමැති හෙයින් දිගින් දිගටම මෙම ගැටළුව පැවතිය නොහැකි හෙයින් මෙවර විසඳිය හැකි තත්ත්වය විසඳා ගැනීමට කටයුතු කලයුතු අතර ඒ සඳහා කඩිනම් සාකච්ඡාවක් ලබා ගතයුතු බවට පැහැදිලි කරන ලදි. | නායකත්වය එක්ව් සාකච්ඡා කර සුදුසු යෝජනා හා විසඳුම් ලබා ගන්නා ලෙස දැනුම් දෙන ලදි. | කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>හම්බන්තොට |
| **අනතුරුව 2025.05.28 දිනට අදාල න්‍යාය පත්‍රයේ කරුණු සාකච්ඡා කරන ලදි. ඒවා පහත පරිදි වේ.** | | | | |
| 04. | පළාත් සභා සංවර්ධන වැඩසටහන් සම්බන්ධව දැනුවත් කිරීම. | 2025 වර්ෂයට අදාලව දකුණු පළාත් සංවර්ධන සැලැස්ම තුළ හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා<br>• **පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) - රු.මි. 1,679.25**<br>• **උපමාන පාදක ප්‍රදාන (CBG) - රු.මි. 141.14**<br>වශයෙන් මුළු මුදල රු.මි. 1,820.39 ක් වෙන්කර ඇති අතර ව්‍යාපෘති 558 යටතේ එකී මුදල් දකුණු පළාත් සභාවේ ඒ ඒ විෂයන්ට අදාලව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මඟින් ක්‍රියාත්මක වන බවත් ප්‍රකාශ කරන ලදි.<br>එසේම, 2025.04.30 දිනට<br>- **මූල්‍ය ප්‍රගතිය**<br>අනුමත මුදල රු.මි. 1,617.43<br>වියදම රු.මි. 20.04<br>- **භෞතික ප්‍රගතිය**<br>වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව - 15<br>ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සංඛ්‍යාව - 485<br>වැඩ ආරම්භ කිරීමට නියමිතව ඇති ව්‍යාපෘති සංඛ්‍යාව - 58<br>• **ග්‍රාමීය පාලම් වැඩසටහන සඳහා - රු.මි.8.40**<br>මෙකී ග්‍රාමීය පාලම් ව්‍යාපෘති ඕකෙවෙල, බෙලිඅත්ත, වලස්මුල්ල, වීරකැටිය සහ සූරියවැව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මුල්කරගනිමින් ක්‍රියාත්මක කෙරේ.<br>• **"Clean Sri Lanka" (අයවැය ප්‍රතිපාදන) වැඩසටහන සඳහා - රු.මි. 25**<br>**"සියළුම දරුවන්ට සමාන ඉගනුම් අවස්ථා ලබා දීම" අරමුණ කරගනිමින්**<br>- අත්‍යාවශ්‍ය ප්‍රතිසංස්කරණ/ ඉදිකිරීම් සඳහා ව්‍යාපෘති 4 ක් | පළාත් සභා අමාත්‍යාංශ මඟින් දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරනු ලබන සියළු සංවර්ධන වැඩසටහන් සඳහා සියළු දෙනාගේම සහයෝගය ලබා දෙන ලෙස දැනුම් දෙන ලදි. | ප්‍රධාන ලේකම්, දකුණු පළාත<br><br>අමාත්‍යාංශ ලේකම්වරුන්, දකුණු පළාත් සභාව<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සැලසුම් හා මෙහෙයුම් (දකුණු පළාත)<br><br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන් |

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | (රු.මි.8) තංගල්ල, තිස්සමහාරාම, ඕකෙවෙල සහ වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මුල්කරගනිමින් ක්‍රියාත්මක බවත්,<br>- සිසුන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘති 7 ක් (රු.මි.17) බෙලිඅත්ත, තිස්සමහාරාම, වීරකැටිය සහ සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පාසල් මුල්කරගනිමින් ක්‍රියාත්මක බවත් විස්තර කරන ලදී. | | |
| 05 | නගරයේ පවතින පොදු වැසිකිළි සඳහා ප්‍රමාණවත් පහසුකම් ඇති කිරීම | පාසල් වල හා පොදු වැසිකිළි සඳහා ප්‍රමානවත් ලෙස සනීපාරක්ෂක පහසුකම් තිබිය යුතු හෙයින් එකී අවශ්‍යතා හඳුනාගත යුතු බවත් බස්නැවතුම්පළ ඇතුළත වැසිකිළි එම තත්ත්වයට ගැනීමට පළාත් සභාවෙන් අවශ්‍ය ප්‍රතිපාදන ලබා දිය හැකි බවටත් දැනුම් දෙන ලදී. | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියත් සමඟ සාකච්ඡාකර බස්නැවතුම්පළ ඇතුළත වැසිකිළි මෙම තත්ත්වයට ගැනීමට කඩිනමින් ඇස්තමේන්තු ලබා දෙන ලෙස උපදෙස් දෙන ලදී. | නාගරික කොමසාරිස්<br><br>කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ – හම්බන්තොට/ තංගල්ල/ වලස්මුල්ල |
| 06. | සංවර්ධන වැඩසටහන් සම්බන්ධ දැනුවත් කිරීම | 2025 වර්ෂය සඳහා<br>• විමධ්‍යගත අයවැය වැඩසටහන<br>දිස්ත්‍රික්කය සඳහා හඳුනාගෙන අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යෝජනා අතුරින් රු.මි.80 ක් සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 සඳහා යෝජනා 49 ක් සඳහා අනුමැතිය ලැබී ඇති බවත්, සියළු ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දී ඇති බව දන්වා ඇත.<br>විවිධ හේතු නිසා තංගල්ල, සූරියවැව, වීරකැටිය, අම්බලන්තොට, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලින් රු.මිලියන 13.5කට අදාලව යෝජනා 07 ක් සංශෝධන සඳහා ඉදිරිපත් කර ඇති බව දැනුම් දෙන ලදී.<br>• ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන<br>ප්‍රවාහන මහාමාර්ග , වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය මගින් දිස්ත්‍රික්කය තුළ සංවර්ධනය කළ යුතු ග්‍රාමීය මාර්ග හඳුනා ගෙන අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස ලබා දී තිබූ චක්‍රලේඛ උපදෙස් පරිදි සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලින් ප්‍රාදේශීය | අනුමතකර ඇති සියළු ව්‍යාපෘති නියමිත චක්‍රලේඛ හා ප්‍රසම්පාදන ක්‍රම වලට අනුකූලව ක්‍රියාත්මක කරන ලෙසත් විමධ්‍යගත සංශෝධන සහ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහනේ ව්‍යාපෘති , සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබා දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම්<br><br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br><br>දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් |



විමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | | සම්බන්ධීකරණ කමිටු වල නිර්දේශ සහිතව ඉදිරිපත් කර තිබූ යෝජනා අතුරින් රු.මි.500කට අදාල යෝජනා 115ක් අමාත්‍යාංශය වෙත අනුමැතියට යොමු කළ බවත් මාර්ග කාපට් අතුරා සංවර්ධනය කිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු කාර්යාලය වෙතින් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 07කට අදාලව ව්‍යාපෘති යෝජනා 14ක් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.<br>• දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අනෙකුත් සංවර්ධන යෝජනා.<br>ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය මගින් ජීවනෝපාය සංවර්ධන යෝජනා හඳුනාගන්නා ලෙසත් දිස්ත්‍රික්කයේ සෑම ග්‍රාම නිලධාරී වසමක්ම නියෝජනය වන පරිදි සැලසුම් සකස්කරමින් පවතින බවත් දැනුම් දෙන ලදි. | | |
| 07. | සංවර්ධන ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේ දී ගැටළු මතුවීම. | දිස්ත්‍රික්කය සඳහා ලැබී ඇති ව්‍යාපෘති ප්‍රාදේශිය ලේකම් වරුන්ට ලබා දී ඇති අතර ඒවා සඳහා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා දිස්ත්‍රික් ඉංජිනේරු විසින් නිසි උපදෙස් හා මිල ගණන් (Rates) තාක්ෂණික නිලධාරීන්ට ලබා දී නොමැති බැවින් ඇස්තමේන්තු සැකසීම සිදු නොවන බවට කරුණු ඉදිරිපත් විය. මෙනිසා ව්‍යාපෘති අවසන් කිරීම සඳහා ලබා දී ඇති කාලය තුළ ඒවා අවසන් කර ගැනීමට නොහැකිවීමේ අවධානමක් මතුවන බවටත් පෙන්වා දෙන ලදි. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය දකුණු පළාත් ඉංජිනේරු කාර්යාලය මගින් ලබා දෙන Rates භාවිතා කල හැකි බවත් අවශ්‍ය වන විට දිස්ත්‍රික් ඉංජිනේරු විසින්ද Rates සකස්කර ගැනීමේ හැකියාවක් පවතින බවටත් කරුණු ඉදිරිපත් විය. තවද, අවශ්‍යතාව අනුව විශ්‍රාම ගිය තාක්ෂණික නිලධාරීන්ද කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගැනීමේ හැකියාවක් පවතින බවත් දන්වන ලදි. | ප්‍රාදේශිය ලේකම් කාර්යල සඳහා ඇස්තමේන්තු සැකසීමට අදාල ගාස්තු, Rates හා මිල විශ්ලේෂණ ලබා දීම දිස්ත්‍රික් ඉංජිනේරුගේ වගකීමක් බවත් වෙනත් ආයතන වලින් ( වාරිමාර්ග, පළාත් වාරිමාර්ග සංවර්ධන අධිකාරිය,.. වැනි ) Rates ලබාගතයුතු නම් ඒවා නොපමාව තාක්ෂණ නිලධාරීන්ට ලබා දිය යුතු බවත් Rates නොමැති විශේෂ අවස්ථාවල ඒ සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාල මගින් මිල ගණන් ලබා ගෙන ඒ අනුව මිල ගණන් සකස් කර ඒවා දිස්ත්‍රික් ඉංජිනේරු විසින් අනුමත කළ යුතු බවටත් දැනුම් දෙන ලදි. | දිස්ත්‍රික් ඉංජිනේරු<br><br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන් |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | එසේම, පාසල් සඳහා ලැබෙන ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදීද මෙකී ගැටළුවම පවතින බවටත් අනෙක් ආයතනවල පවතින තාක්ෂණික සහාය මේ සඳහා ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදි. | එකී තාක්ෂණික සහාය අවශ්‍ය විටෙක ඉල්ලීම් කරන ලෙස දැනුම් දෙන ලදි. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, හම්බන්තොට/ තංගල්ල/ වලස්මුල්ල |
| 08.1 | දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය තත්ත්වය පැහැදිලි කිරීම. | තංගල්ල සහ තිස්සමහාරාම ස්ථානභාර රෝහල් වෛද්‍යවරුන් නොමැති බවත් තිස්සමහාරාම සහ හම්බන්තොට පරිපාලන නිලධාරීන් නොමැති බවත් පෙන්වා දෙන ලදි.<br>එසේම, දිස්ත්‍රික්කයේ පවතින තත්ත්වයන් පහත කරුණු මුල්කරගනිමින් පැහැදිලි කරන ලදි.<br>**ඩෙංගු රෝගය,**<br>2024 වර්ෂයට සාපේක්ෂව 2025 වර්ෂයේ මේ වන විට මදුරු කීටයන් හඳුනාගැනීම් අවස්ථා ඉහළ ගොස් ඇති බවත් ඉදිරියේදී එන වැසිකාලයත් සමඟ ගෘහ සහ පොදු ස්ථාන, වරායන් ආශ්‍රිතව හා ජලය ගබඩා විය හැකි සියළු ස්ථාන පිළිබඳ වැඩි සැලකිල්ලක් දක්වන ලෙසත් තංගල්ල වරාය හොඳින් මේ සම්බන්ධව පාලන කටයුතු සිදුවන හෙයින් එකී කටයුතු අනෙක් වරායන් සඳහා දියත් කිරීමට පියවර ගැනීමට ඉදිරියේදී සැලසුම් කර ඇති බවත් විස්තර කරන ලදි.<br>**මී උණ**<br>මෙම වර්ෂයේ එක් මරණයක් සිදුවී ඇති බවත් කුරුඳු ඉඩම්, කාණු පද්ධති වැනි මීයන් ගැවසෙන ප්‍රදේශ ආශ්‍රිතව රෝගීන් වාර්තාවීම ඉහළ ගොස් ඇති බවත් අවශ්‍ය වෛද්‍ය උපදෙස්, ආරක්ෂිත උපක්‍රම පිළිබඳව සැලකිළිමත් වන ලෙසත් දැනුවත් කරන ලදි.<br>**යෞවන අවධියේ ගැබ්ගැනීම් ඉහළයාම**<br>මෙම තත්ත්වය වර්ධනය වීමක් පෙන්නුකරන බව හා ඒ සඳහා අඟුණකොළපැලැස්ස රෝහල මූලික කර ගනිමින් මිතුරු පියස හා යොවුන් පියස යන වැඩසටහන් ආරම්භ කර ඇති බවත් ඉදිරියේදී අනෙක් රෝහල් වලද එකී වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර ඇති බවත් | සියළු රෝහල් වල හිඟ බෙහෙත් තත්ත්වය සහ එකී බෙහෙත් හිඟය විසඳා ගැනීමට ගෙන ඇති පියවර මොනවාද යන්න මාසිකව වාර්තා කරන ලෙස සහ රෝහල් වෛද්‍යවරුන්ගේ සේවා අවශ්‍යතාවය දැනුම් දෙන ලෙස පැහැදිලි කරන ලදි. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br><br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, හම්බන්තොට/ තංගල්ල/ වලස්මුල්ල |



බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | පෙන්වාදෙන ලද අතර, පාසල්වල 11 ශ්‍රේණියේ විද්‍යාව පෙළපොතෙහි ප්‍රජනන සෞඛ්‍ය පාඩම නියමිත පරිදි ඉගැන්වීම සිදු නොවීම මෙවැනි ගැටළුවලට හේතුවක්වීම නිසා එකී දැනුම ලබා දීමට පාසල් සඳහා අවශ්‍ය සහාය ලබාදිය හැකි බවද දන්වන ලදි.<br>**සියදිවි නසාගැනීම්**<br>සියදිවි නසාගැනීම සඳහා උත්සාහ කිරීමේ ප්‍රවනතාව ඉහළයාම හේතුවෙන් අවශය පරිදි උපදේශන සේවාව පුළුල් කරමින් පවතින බව. | | |
| 8.2 | සූරියවැව ආයුර්වේද රෝහලෙහි පවතින අවශ්‍යතා | ජංගම සේවාව සඳහා ප්‍රවාහන පහසුකම් හා ඔසු උයන් පවත්වා ගැනීමට අවශ්‍ය මැදිහත්වීම ලබා දෙන ලෙස හා මේ වන විට ප්‍රජා සෞඛ්‍ය සේවාව මගින් පෙර පාසල් හා පාසල් ළමුන් සඳහා අවශ්‍ය සෞඛ්‍ය සේවාව ලබා දෙන බව පැහැදිලි කරන ලදි. | න්‍යාය පත්‍රයට ආයුර්වේද වෛද්‍ය සේවාව ඇතුලත් කරන ලෙස හා ළමුන් ඉලක්ක කරගනිමින් මෙම සේවාව පුළුල් කරන ලෙසත් දැනුම් දෙන ලදි. | අධ්‍යක්ෂ(ක්‍රමසම්පාදන)<br><br>ආයුර්වේද වෛද්‍ය |
| 09. | දිස්ත්‍රික්කය තුළ පවතින ආරක්ෂක තත්ත්වය පිළිබඳ දැනුවත් කිරීම | වැටලීම් සිදුකිරීම ප්‍රමාණාත්මකව වැඩිකිරීමත් යුධ හමුදාව හා පොලිස් විශේෂ කාර්ය බලකාය යොදා ගනිමින් උදේ සවස ලෙස මුර සංචාරය කිරීම් සිදුකරන බවත් එහි මේ වන විට ප්‍රගතියක් පවතින බව ද දිස්ත්‍රික්කයේ පසුගිය ආසන්න කාලය තුළ මහාපරිමාන වශයෙන් වැටලීම් කර මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීමට මැදිහත්වූ බවද පැහැදිලි කරන ලදි. | මත්ද්‍රව්‍ය පෙරීම් ගම්මාන වශයෙන් නිදහසේ සිදුවන බව හා පුවක්දණ්ඩාව, රන්න, කඳුරුපොකුණ, අඳුපැලැන, බඳගිරිය, තිස්සමහාරාම හා ලුණුගම්වෙහෙර අවට වැඩිවශයෙන් පවතින බවත් වැටලීම් කර හෝ මෙම අය අත්අඩංගුවට ගෙන නීතිය ක්‍රියාත්මක කරන ලෙස හා සිවිල් ආරක්ෂක කමිටුව පිහිටුවීම නව චක්‍රලේඛ අනුව නැවත යාවත්කාලීන කරන ලෙස උපදෙස් දෙන ලදි. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල |
| 10. | Whatsapp ගිණුම් තුළට අනවසරයෙන් ඇතුල්වීම. | මෙම ගිණුම් තුළට අනවසරයෙන් ඇතුළුවී රිසිසේ මුදල් වංචා සිදුකරන බව හා එම සිදුවීම් පැමිණිලි කළද අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ ගැටළුවක් පවතින බව හා මෙහිදී මුදල් වංචාකිරීම් සඳහා භාවිත ගිණුම් පරීක්ෂා කිරීමෙන් තොරතුරු හඳුනාගැනීමට හැකි බවත් පැහැදැලි කරන ලදි. | මෙවැනි ක්‍රියා නොවීමට කඩිනම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් දෙන ලදි. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල |
| 11. | තිස්සමහාරාම ප්‍රාදේශිය සභාව සතු බහුකාර්ය ගොඩනැගිල්ලේ තොරතුරු ලබා ගැනීම | මෙම ගොඩනැගිල්ලෙහි වැඩකටයුතු අවසන් කර ප්‍රාදේශිය සභාව වෙත කඩිනමින් පැවරිය යුතු හෙයින් දැනට අතරමඟ නතරවී ඇති වැඩ කොටස් කඩිනමින් අවසන් කල | තොරතුරු දැනගැනීමේ පනත යටතේ හෝ අවශ්‍ය තොරතුරු ලබාගත හැකි බැවින් මෙකී ගොඩනැගිල්ලට අදාල සියළු තොරතුරු | නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය, හම්බන්තොට |



විමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CS CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | යුතු බවත් ඒ සඳහා ගොඩනැගිල්ලේ සැළසුම් (Plan) අවශ්‍ය බවත් දන්වන ලදි. මෙම ගොඩනැගිල්ලේ වැඩකටයුතු CECB ආයතනය මඟින් සිදුකල බවත් නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය සහ එකී කොන්ත්‍රාත් ආයතනය ගිවිසුම් පාර්ශව වූ බවත් නාගරික සංවර්ධන අධිකාරිය (හම්බන්තොට කාර්යාලය) ගෙවීම් සඳහා බිල්පත් සකස් කිරීම පමණක් කල බවත් ගොඩනැගිල්ලේ සැලසුම් ඔවුන් ලඟ නොමැති බවත් ප්‍රකාශ කළේය.<br>ඒසේම, මෙකී ගොඩනැගිල්ලෙහි තෙවන මහල ඉදිකිරීම සඳහා මෙහි සැලසුම් නොමැතිව කිසිදු ඉදිරි පියවරක් ගැනීමට කටයුතු කල නොහැකි බවත් දැනුම් දෙන ලදි. | කඩිනමින් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් දෙන ලදි. | |
| 12. | **ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටු මඟින් ඉදිරිපත් වී ඇති යෝජනා** | | | |
| 12.1 | මැටි කැනීම හා ප්‍රවාහනය සම්බන්ධව උඩුකිරිවිල ගම්වාසීන් විසින් කරනු ලැබූ උද්ඝෝෂණය - වීරකැටිය ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුව | මැටි කැණීම කොට, ගුලි කර ප්‍රවාහනය සඳහා බලපත්‍රයකින් තොරව අවසර ලබා දෙන ලෙස හා "ඉදිකිරීම් කර්මාන්ත සඳහා භාවිතා කරන ඛණිජ කැණීම, ප්‍රවාහනය සහ වෙළදාම පිළිබඳ කාර්ය සංග්‍රහයේ" 5 වන පරිච්ඡේදයේ 5.1 යටතේ මැටි කැණීම සහ ප්‍රවාහනය සඳහා බලපත්‍රයක් ලබාගත යුතු අතර එහි පවතින කොන්දේසිද සම්පූර්ණ කල යුතු වේ. නමුදු මෙකී කොන්දේසිද ඉවත් කර දෙන ලෙස උද්ඝෝෂකයින් ඉල්ලා සිටින බවට කරුණු ඉදිරිපත් විය.<br>තවද, හම්බන්තොට කැලියපුර මැටිකර්මාන්තකරුවන් සඳහා ද අවශ්‍ය මැටි ලබාගැනීමේ ගැටළුකාරී තත්ත්වයක් ඇතිවී තිබෙන බවට කරුණු ඉදිරිපත් විය.එහිදී ප්‍රකාශ වූයේ වන සංරක්ෂණ සීමාවෙන් මැටි ලබා ගැනීම සඳහා අවසර ඉල්ලා වනසංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්ට ලිපියක් යොමු කර ඇති බවයි. | සම්බන්ධීකරණ කමිටු සභාපතිගේ මූලිකත්වයෙන් අදාල පාර්ශව වල නියෝජිතයින්ද කැඳවා කඩිනම් විසඳුමකට එළඹෙන ලෙසත් අවශ්‍ය අවස්ථාවල දකුණු පළාත් සභා විෂයභාර අමාත්‍යාංශයද මැදිහත් කර ගන්නා ලෙස උපදෙස් දෙන ලදි.<br><br>ඒ අනුව, අවශ්‍ය කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් දෙන ලදි. | ලේකම්, දකුණු පළාත් ධීවර, සත්ව නිෂ්පාදන, ග්‍රාමීය කර්මාන්ත, .. අමාත්‍යාංශය<br><br>ප්‍රාදේශිය ලේකම්, වීරකැටිය<br><br>ප්‍රාදේශිය ලේකම්, හම්බන්තොට.<br><br>දිසා වන නිලධාරී, හම්බන්තොට |

බිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 12.2 | තැපැල නොබෙදීම - කැලියපුර, සිරිබෝපුර, සහ කොහොලංකල යන ග්‍රාම නිලධාරී වසම් තුළ - හම්බන්තොට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව | මෙම ගම්මාන තැපැල බෙදීමේ සීමාවන් සඳහා ඇතුලත්ව නොමැති බවත් ඒ සඳහා යෙදවීමට නිලධාරී හිඟයක් පවතින බවත් සාකච්ඡා විය. | නියෝජ්‍ය තැපැල්පති වෙත දැනුම් දීමට තීරණය විය. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) |
| 13. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත්වී ඇති යෝජනා | | | |
| 13.1 | කුකුල් ගොවිපළක් සඳහා හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අරවනමුල්ල ග්‍රාමනිලධාරී වසමෙන් අක්කර 05ක බිම් කොටසක් ලබා ගැනීම. | මහවැලි බලප්‍රදේශයට අයත් මෙම ඉඩම් කොටස සඳහා මහවැලි අධිකාරියෙන් අනුමැතිය ලබා දී ඇති අතර මෙම කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. | ඉදිරි කටයුතු සඳහා සවිස්තර වාර්තාවක් ලබා දෙන ලෙස දැනුම් දෙන ලදි. | නේවාසික ව්‍යාපාර කළමනාකරු, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ඇඹිලිපිටිය. |
| 13.2 | හුංගම විජයබා ජාතික පාසලේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇති අනුමැතියට අදාලව ඉදිරි කටයුතු සිදුකිරීම . | මෙකී ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇති අනුමැතියට අදාලව ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා මෙම කමිටුවේ අනුමැතිය අවශ්‍ය බවත් එකී අනුමැතිය තීරණය කිරීමට අදාල මූලික කරුණු හඳුනා ගැනීම සඳහා ක්‍රීඩා හා අධ්‍යාපන අමාත්‍යාංශ දෙකද එක්ව 2025.06.03 වන දින පෙ.ව. 9.00ට අදාල සියළු පාර්ශවයන්හි ප්‍රධාන සාමාජිකයින් හා අදාල නිලධාරීන් රැස්ව නිවැරදි තීරණයක් ගතයුතු බවට සාකච්ඡා විය. | මෙම දිනට සියළු පාර්ශව එක්ව පැහැදිළි එකඟතාවයකට යොමුවී ලිඛිතව එය වාර්තා කරන ලෙස දැනුම් දෙන ලදි. | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, දකුණු පළාත<br><br>කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ, හම්බන්තොට |
| 13.3 | දේශගුණික බලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන යටතේ ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම. | මෙම ව්‍යාපෘතියේ අවසන් අදියර ක්‍රියාත්මක වන බවත් අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ව්‍යාපෘති - 2 ක්, වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ව්‍යාපෘති - 2 සහ වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ව්‍යාපෘති - 1 ක් වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතියට ඉදිරිපත් කරන ලදි. | කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදි. | වාරිමාර්ග ඉංජිනේරු, වීරකැටිය |
| 13.4 | ජල සම්පාදන මණ්ඩලය මගින් ඉදිරිපත් කර ඇති යෝජනා | | | |
| 13.4.1 | මිද්දෙණිය ජල යෝජනා ක්‍රමය | අදියර දෙකකින් සමන්විත මෙම ව්‍යාපෘතිය අමුජලය ලබා ගන්නා ප්‍රභවය සඳහා මහවැලි අධිකාරියේ අනුමැතියද ලැබී ඇති අතර අදාල ප්‍රදේශවල උග්‍ර පානීය ජල හිඟය පියවීම සඳහා උප අදියර කීපයක් යටතේ ප්‍රතිපාදන වෙන්කරවා ගැනීම සඳහා මෙම කමිටුවේ අනුමැතියට ඉදිරිපත්කර ඇත. | කමිටුවේ අනුමැතිය ලබා දුන් අතර ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා විෂයභාර අමාත්‍යාංශය වෙත දැනුම් දෙන ලෙස උපදෙස් ලබා දෙන ලදි. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දකුණ), ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය |



ඕමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 13.4.2 | නවයාලවිල ජලාශය සංවර්ධනය කිරීමේ කෙටි කාලීන පියවර | මෙම යෝජනාව ක්‍රියාත්මක අවස්තාව වන විට අනවසර වගා කරුවන් එකී ප්‍රදේශයෙන් ඉවත්වීමට කැමත්ත ඇති බවත් තංගල්ල - නලගම ජල පවිත්‍රාගාරය සඳහා වසරේ නියංකාලවලදී උග්‍ර ලෙස පවතින අමු ජල හිඟය පියවීම ද සිදුකල හැකි බවත් පැහැදිලි කරන ලදි.<br>එසේම මෙම ජලාශයෙන් මේ වන විටත් මැටි ආශ්‍රිත කර්මාන්තකරුවන් මැටි ලබාගන්නා ස්ථානයක් බැවින් මෙකී ඉවත් කරන මැටි මෙම කර්මාන්තකරුවන්ටද ලබා ගැනීමට අවස්ථාව ලබා දෙන ලෙසද ඉල්ලා සිටින ලදි. | මෙකී කෙටිකාලීන පියවර ආරම්භ කිරීමට අනුමැතිය ලබා දෙන ලදි.<br>ඊට අදාල සහයෝගය ලබා දෙන ලෙස දැනුම් දෙන ලදි. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දකුණ), ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ප්‍රාදේශිය ලේකම්, බෙලිඅත්ත |
| 13.4.3 | වකමුල්ල ප්‍රදේශයෙහි උග්‍ර ජල හිඟය | දැනට අමුජලය ලබා ගන්නා ස්ථානයෙන්ම දිනකට අක්කර අඩි 4ක් ලබා ගැනීමට අදාල සැලසුම් සකස් කර ප්‍රතිපාදනද ලබා ගැනීමට ද කටයුතු කර අති බවත් මේ සඳහා අවශ්‍ය අනුමැතිය වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට ඉල්ලුම් කලද මෙතෙක් ඒකී අනුමැතිය නොලද බවට කරුණු ඉදිරිපත් විය. | නැවත වරිමාර්ග ප්‍රධාන කාර්යාලයෙන් ඉල්ලීම සිදුකරන ලෙස උපදෙස් දෙන ලදි. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දකුණ), ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| 13.4.4 | මුරුතවෙල/ වීරකැටිය ප්‍රදේශවල උග්‍ර පානීය ජල හිඟය | මුරුතවෙල ජලාශයෙන් දැනට අමුජලය අක්කර අඩි 4ක් ලබා ගන්නා ස්ථානයෙන්ම දිනකට අක්කර අඩි 5ක් ලබා ගැනීමට අවශ්‍ය අනුමැතිය වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට ඉල්ලුම් කලද එක් අවස්තාවක අනුමැතිය ලබා දී නැවත එකී අනුමැතිය තාවකාලිකව අවලංගු කර මෙතෙක් එකී අනුමැතිය නොලද බවට කරුණු ඉදිරිපත් විය. මෙකී අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි. | අදාල ආයතන දෙකම මඟින් කරුණු පැහැදිලි කර අමාත්‍යාංශ දැනුවත් කිරීමක් සිදුකරීමට හා නැවත ඉල්ලීමක් සිදුකිරීමට උපදෙස් ලබා දෙන ලදි. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දකුණ), ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 14 | වෙනත් කරුණු | | | |
| 14.1 | මගී ප්‍රවාහනය කරනු ලබන ත්‍රිරෝද රථ නියාමන වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීම. | ත්‍රිරෝද රථ ලියාපදිංචි කර විධිමත් මගී ප්‍රවාහන සේවාවක් ඇති කිරීම හා නියාමනයට ලක් කිරීම උදෙසා ත්‍රිරෝද රථ සඳහා බලපත්‍ර ලබා දීම ආරම්භ කර ඇති බවත් නීතිමය තත්ත්වය පුළුල් කර මෝටර් රථ පනත සංශෝධනය කර අංක 1821/31-2013-7-31 දිනෙන් නිකුත් කර ඇති විශේෂ ගැසට් නිවේදනය මඟින් සියළු මගී ප්‍රවාහන ත්‍රිරෝද | ත්‍රි රෝද රථ භාවිතවීම වැඩි වශයෙන් සිදුවන බැවින් සමාජය තුළ පවතින විවිධ ගැටළුකාරී තත්ත්වයන්ගෙන් මිදී ආරක්ෂාකාරී ප්‍රවාහන සේවාවක් සැපයීමේ අරමුණින් ත්‍රි රෝද රථ නියාමනයකට ලක්කිරීම අත්‍යාවශ්‍ය ක්‍රියාවක් බවත් ඒ සඳහා පොලිසිය ඇතුළු | සභාපති, දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය<br>ජේෂ්ඨ පොලිස් අධිකාරී, තංගල්ල |



බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | රථ සඳහා මගී ප්‍රවාහන අධිකාරිය යටතේ මගී ප්‍රවාහන බලපත්‍රය ලබා ගැනීම, ගාස්තු මීටර් සවි කිරීම ඇතුළු නීති මාලාවක් නිකුත් කර ඇති බවත්, ඒ අනුව සියළු මගී ප්‍රවාහන ත්‍රිරෝද රථ අධිකාරියේ මගී සේවා අවසර පත්‍රයක් ලබා ගෙන මගී ප්‍රවාහනයේ යෙදීම අනිවාර්ය බවත් එකී අවසර පත්‍ර ලබාදීම www.sptaxi.lk වෙබ් අඩවිය හරහා ලබා ගැනීමට අවස්ථාව හා තාක්ෂණය භාවිතය තුළ ත්‍රිරෝද රථයේ QR කේත මඟින් මගියාට හා ත්‍රිරෝද රථ හිමියාටද පහසුකම් සලසා ඇති බවද විස්තර කරන ලදි.<br>මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ආරක්ෂක අංශවල සහයෝගය අවශ්‍ය වන බව දන්වන ලදි. | අනෙකුත් ආයතනවල සහාය ලබා දෙන ලෙසත් උපදෙස් දෙන ලදි. | |
| 14.2 | සූරියවැව වීරියගම ප්‍රදේශයේ නිදන් ලබා ගැනීමේ අරමුණින් කැණීම් සිදුකිරීම. | අංක 5378, අලිබලු ආර සූරියවැව ලිපිනයේ පදිංචි ජී. ක්‍රිෂ්ණා මධුවන්ති නැමැත්තිය අක්කර 02ක පමණ වපසරියක කෙසෙල් වගාවක් පවත්වාගෙන යමින් එකී ඉඩම තුළ වගා ළිදක් කපන මුවාවෙන් නිදන් වස්තු ලබා ගැනීමට කැනීම් කරන බව හා එහි ඇති ගල්තලය විදිමින් කැණීම් සිදුකිරීම සම්බන්ධයෙන් විදාන ගමගේ අජිත් යන අය සූරියවැව පොලිස් ස්ථානය මඟින් 2025.01.19 දින අත් අඩංගුවට ගෙන ගරු අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බවත් මහවැලි අධිකාරියට අයත් ඉඩමක් හෙයින් 2025.01.28 දිනැතිව මහවැලි අධිකාරි කාර්යාලයෙන් නිරීක්ෂිත කරුණු 6 ක් යටතේ වාර්තාවක් ඉල්ලීම් කලද මෙතෙක් නොලැබුන බවට දන්වන ලද අතර අනෙක් ආයතන හා බලධාරීන් දැනුවත් කර මහජන කැලඹීමක් ඇති නොවීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා සිටින ලදි. | මෙම ඉඩමෙහි නිවැරදි අයිති කරු කවුරුන්ද යන්න ඇතුළු පැහැදිලි වාර්තාවක් දින 5 ක් ඇතුලත ලබා දෙන ලෙස අවධාරණය කරන ලදි. | නේවාසික ව්‍යාපාර කළමනාකරු, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ඇඹිලිපිටිය. |
| 14.3 | එරම්ණියාය සෞන්දර්ය නිකේතනය සඳහා 2025 වර්ෂයට අභ්‍යාසලාභීන් බඳවා ගැනීම. | සංගීත හා නර්තන පාඨමාලා සඳහා NVQ Level -04 අදාලව අභ්‍යාසලාභීන් බඳවා ගැනීම මේ දිනවල සිදුවන බවත් ගාස්තු අයකිරීමක් සිදු නොකරන බව හා නේවාසික හා ආහාර පාන නොමිලේ ලබාදීමේ පහසුකම්ද | මෙම පාඨමාලා පහසුකම් තම සියළු ආයතන හා අදාල පිරිස් දැනුවත් කිරීමට උපදෙස් දෙන ලදි. | සභාපති , ජාතික තරුණ සේවා සභාව |



එල් ඉන්දුජිත් ද සිල්වා
මහලේකම් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | සැලසෙන අතර<br>* වයස අවුරුදු 18 – 24 අතර වීම,<br>* අ.පො.ස(සා.පෙළ.) විභාගයට පෙනී සිට තිබීම ,<br>* නර්තන විෂය හදාරා තිබීම හා යෞවන සමාජ සාමාජිකත්වය විශේෂ සුදුසුකමක් වීම,<br>යන සුදුසුකම් මත ප්‍රධාන කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංස්කෘතික) – 0714865120 විසින් සම්බන්ධීකරණ කටයුතු සිදුකරනු ලබන බව දැනුම් දෙන ලදි. | | |
| 14.4 | පුනරුත්ථාපන මධ්‍යස්ථාන ආරම්භ කිරීම සඳහා සුදුසු පරිශ්‍රයන් හඳුනා ගැනීම. | මෙකී කර්තව්‍ය සඳහා මධ්‍යස්ථාන 3ක් පමනක් වීම හා පැවති අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු උපදේශක කාරකසභා පූර්ව රැස්වීමේදී අන්තරායකර ඖෂධවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමට දිස්ත්‍රික් වශයෙන් පුනරුත්ථාපන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු වී ඇති අතර ඒ සඳහා දිස්ත්‍රික්කයෙන් අක්කර 07ක භූමි ප්‍රමාණයකින් යුතු සුදුසු ඉඩමක් (ගොඩනැගිලි සමන්විත වේ නම් වඩා ඵලදායී) තිබෙනම් අමාත්‍යාංශය දැනුවත් කරන ලෙස ඉල්ලා ඇති බවට දැනුම් දෙන ලදි. | ඉඩම් හා ගොඩනැගිලි පහසුකම් පිළිබඳ තොරතුරු ලබා දෙන ලෙස දන්වන ලදි. | ලේකම්, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය<br><br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්<br><br>නේවාසික ව්‍යාපාර කළමනාකරු, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ඇඹිලිපිටිය. |
| 14.5 | ඕකෙවෙල නතුවල සමගි මාවත සිට හේමාලෝක මාවත දක්වා මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපාදන නොමැති වීම. | මෙම ව්‍යාපෘතිය සඳහා රු.33,346,504.00ක ඇස්තමේන්තුවක් මාර්ග සංවර්ධන අධිකාරියෙන් සකස් කර ඇති අතර එවකට පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් රු..6,865,256,.24 ක වැඩ නිම කර ව්‍යාපෘතිය අතරමග නතරකර ඇත. එබැවින් මෙකී ව්‍යාපෘතියේ ඉතිරිකටයුතු සඳහා ප්රතිපාදන සපයා ගැනීමේ ගැටළුවක් පවතින බව සාකච්ඡා විය. | ඉතිරි කොටස කාපට් කර සම්පූර්ණ කිරීමට අදාලව ප්‍රාදේශිය සභාවට අයත් මාර්ගයක් බැවින් ඒ අනුව ඇස්තමේන්තුව සකසා ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටු අනුමැතිය යටතේ ලබා දෙන ලෙස දැනුම් දෙන ලදි. | ප්‍රාදේශිය ලේකම්, ඕකෙවෙල<br><br>ලේකම්, ප්‍රාදේශිය සභාව, වීරකැටිය. |
| 15 | පළාත් පාලන ආයතන සඳහා බඳවාගෙන ඇති කණිෂ්ඨ කාර්යමණ්ඩලයට නිත්‍ය රාජකාරියෙන් බැහැරව වෙනත් රාජකාරී පැවරීම. | මෙසේ බඳවාගෙන ඇති කාර්යමණ්ඩලයට අයත් නිලධාරීන් අතරින් ඇතැම් කොටසක් තමාගේ නිත්‍ය තනතුරෙහි රාජකාරී වලට නොයොදා වෙනත් කාර්යයන්හි යොදවා ඇති බව වාර්තා වී ඇති බවත් එය නිවැරදි කර ගැනීම සඳහා අවස්ථා කිහිපයකදී පළාත් | 2025 ජූනි 10 දිනට පෙර එම කණිෂ්ඨ කාර්යමණ්ඩලය බඳවා ගෙන ඇති කාර්යයන් සඳහාම අනුයුක්ත කරගන්නා ලෙසත් එසේ නොකරන පළාත් පාලන ආයතන ප්‍රධානීන්ට විනය ක්‍රියාමාර්ග ගැනීමට | සියළුම ප්‍රාදේශිය සභා ලේකම්වරුන්, |

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | පාලන ආයතන ප්‍රධානීන්ට දන්වා ඇතත් එය නිසියාකාරව සිදුව නොමැති බව වාර්තා වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | සිදුවන බව අවධාරණය කරණ ලදි. | |
| 16 | දේශගුණික සුහුරු වාරි කෘෂි ඇළ මාර්ග ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා ගැනීම. | මෙකී ව්‍යාපෘතියේ අවසාන දෙවන අදියර යටතේ ඉදිකිරීමට ඇති ඇළ මාර්ග 23 සඳහාම පියවර අනුමැතිය ලැබී ඇති බවත් හම්බන්තොට ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙතින් මෙකී ව්‍යාපෘති ඉටු කිරීම සඳහා සුදුසු ගොවි සංවිධාන නම් කිරීමට යෝජිත බවට දැනුම් දෙන ලදි. | සුදුසු පරිදි අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ<br><br>ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්, හම්බන්තොට |
| 17. | කිරිදිඹයේ දැව ඉවත් කිරීම | පසුගිය සතිය තෙක් ජලය තිබූ හෙයින් දැව ඉවත් කිරීම් කාර්ය කිරීමට අපහසු වූ බවත් එළඹෙන සඳුදා සිට දැව ඉවත් කිරීම සිදුකල හැකි බව දැනුම් දෙන ලදි. | ඒ අනුව, එළඹෙන සඳුදා සිට දැව ඉවත් කිරීම් කටයුතු සිදුකරන ලෙස උපදෙස් දෙන ලදි. | සහකාර ප්‍රාදේශිය කළමනාකරු, රාජ්‍ය දැව සංස්ථාව, හම්බන්තොට |
| 18. | රන්මිණිතැන්න වෙලි සිනමා ගම්මානය පිවිසෙන මාර්ගය නඩත්තු කිරීම | මෙකී මාර්ගය පළාත් සභාවට අයත් නොවන අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පවතින මාර්ගයක් වන අතර එමනිසා නිසි නඩත්තු කටයුතු සිදු නොවන බවට කරුණු ඉදිරිපත් විය. එබැවින් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට මාර්ගය ලිඛිතව පවරන්නේ නම් පමණක් නඩත්තු කටයුතු සිදු කළ හැකි බවත් එසේ නොවන්නේ නම් කිසියම් ක්‍රමයක් යටතේ මාර්ගය නඩත්තු කිරීමේ ප්‍රතිපාදන ලබා දෙන්නේ නම් මාර්ගය නඩත්තු කල හැකි බවත් දන්වන ලදි. දැනුම් දෙන ලදි. | ඒ අනුව, ගිවිසුමක් යටතේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට නඩත්තු කටයුතු සඳහා ආණ්ඩුකාර ලේකම්ගේ ලිඛිත අවසරයකින් ලබා දෙන ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් ඉංජිනේරු, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය.<br><br>ප්‍රාදේශිය ලේකම්, තිස්සමහාරාම |
| 19. | උද්ධකන්දර ග්‍රාම නිලධාරී වසමේ කුඹුරුවල අසල අනීතික ලෙස බොරළු කපා ප්‍රවාහනය කිරීම. | භූ විද්‍යා හා පතල් කාර්යාංශය මඟින් අවසර පත්‍ර නිකුත් කර ඇති බවත් එහි අධීක්ෂණය වනසංරක්ෂණ කාර්යාලයට පවරා ඇති බවත් ප්‍රකාශ විය.<br>එසේම, අද දින පවතින ක්ෂේත්‍ර පරීක්ෂනයෙන් පසු මෙම කළාපයේ පස් කැපීම සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් ලබා දිය හැකි බවත් පස් කැපීම සඳහා මීට පෙර ලබා දෙන ලද අවසර පත්‍ර 2 ක් අත්හිටුවා තිබී නැවත අද සිට බලාත්මක කරන බවද වැඩිදුරටත් දැනුම් දෙන ලදි. | පස් කැපීම විධිමත්ව සහ නියාමනයකින් යුතුව සිදුවිය යුතු අතර මෙ වන විට පස්කැපීම් සිදුකරන ස්ථාන පිළිබඳ සවිස්තර වාර්තාවන් අදාල නිලධාරීන් විසින් ලබා දෙන ලෙසත් මීට පසු පස් කැපීම සඳහා අවසර ලබාදෙන විට අධීක්ෂණය සඳහා කමිටුවක් පත්කර එකී කමිටුවෙන් තීරණය ලබාගැනීමෙන් පසු සම්බන්ධීකරණ කමිටු අනුමැතියකින් පසු අදාල කැනීම් සිදුකිරීමට පියවර ගන්නා ක්‍රමවේදය අනුගමනය කලයුතු බවට උපදෙස් දෙන ලදි. | සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්<br><br>කැණීම් ඉංජිනේරු, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය.<br><br>දිසා වන නිලධාරී, හම්බන්තොට |



නිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 20. | හදිසි අවශ්‍යතාවයන්වලදී ජලසම්පාදන මණ්ඩලය විසින් ජලය සැපයීම | මෙවැනි අවස්ථාවලදී ජලය සැපයීම සිදුකිරීමේදී විගණනයට ලක් වන හෙයින් මෙකී අවස්තාවලදී මුදල් ගෙවන්නේ නම් ජලය සැපයිය හැකි බවත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු තීරණයක් ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදි. | හදිසි අවස්ථා තත්ත්වයන් පළාත් සභාවට දැනුම් දීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදි. | ප්‍රාදේශිය ලේකම්, තිස්සමහරාම. |
| 21 | දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත සුළං සහ සූර්යබලශක්ති ව්‍යාපෘති. | Win Force ආයතනය විසින් දිස්ත්‍රික්කය තුළ සුළං බලයෙන් ක්‍රියාත්මක වන විදුලි නිෂ්පාදනාගාරයක් ඉදිකිරීමට සහ Infinitive ආයතනය මඟින් සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන විදුලි නිෂ්පාදනාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් ඉල්ලීම් කර ඇති බවට අදහස් ඉදිරිපත් විය. | දේශපාලන නායකත්වය සහ අදාල සියළු පාර්ශව එක්වී මේ සඳහා වෙනම සාකච්ඡාවක් පවත්වා ඒ අනුව ඉදිරි තීරණ ගන්නා ලෙස උපදෙස් ලබා දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්,<br><br>නේවාසික ව්‍යාපාර කළමනාකරු , මහවැලි<br><br>අදාල ප්‍රාදේශිය ලේකම් වරුන්<br><br>නාගරික කොමසාරිස්<br><br>නියෝජ්‍ය අධ්‍යක්ෂ , නාගරික සංවර්ධන අධිකාරිය<br><br>සහකාර අධ්‍යක්ෂ, වනජීවී<br><br>දිසා වන නිලධාරී |

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් පැමිණ සිටි සියලු දෙනාටම ස්තුතිය පල කිරීමෙන් අනතුරුව පස්වරු 2.00 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාප
හම්බන්තොට

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

2025 ජුනි මස ..06.....................
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.



CS CamScanner